# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2048/2 - 2017 දෙසැම්බර් මස 04 වැනි සඳුදා - 2017.12.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ඡන්ද විමසීම් කාල සීමාව තුළදී රජයට හෝ රාජ්‍ය සංස්ථාවලට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළ පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධනයට නැතහොත් අගතියට හේතුවන පරිදි හෝ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමේ කාර්යයට බාධාවන පරිදි හෝ යොදා ගැනීම වැළැක්වීම සඳහා වූ විධාන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (4) (අ) අනුව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් සාදනු ලබන, රජයට හෝ රාජ්‍ය සංස්ථාවකට අයත් යම් නිශ්චල හෝ චංචල දේපළ, ඡන්ද විමසීමේදී පක්ෂ/කණ්ඩායම්/අපේක්ෂකයින් ප්‍රවර්ධනයට නැතහොත් අගතියට හේතුවන පරිදි හෝ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමට බාධාවන අයුරින් යොදා ගැනීම වැළැක්වීම සඳහා මතු සඳහන් විධාන මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

| | | |
|---|---|---|
| මහින්ද දේශප්‍රිය | එන්. ජේ. අබේසේකර | එස්. රත්නජීවන් එච්. හූල් |
| සභාපති | සාමාජික | සාමාජික |
| මැතිවරණ කොමිෂන් සභාව | මැතිවරණ කොමිෂන් සභාව | මැතිවරණ කොමිෂන් සභාව |

2017 දෙසැම්බර් මස 04 වැනි දින,
සරණ මාවත,
රාජගිරිය,
මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104(ආ)(4)(අ) ව්‍යවස්ථාව අනුව "මැතිවරණයක් පවත්වනු ලබන කාල පරිච්ඡේදය තුළ දී, රජයට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළක්" යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ කොරාපක් කර ගැනීම ප්‍රවර්ධනය කිරීමේ හෝ වළක්වාලීමේ කාර්යය සඳහා යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ විසින් භාවිතා කිරීම තහනම් කිරීමේ බලය මැතිවරණ කොමිෂන් සභාවට හෝ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාට අයත්ය. එම ව්‍යවස්ථාවේ (ආ) අනු ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් කරනු ලබන නියමයන් ක්‍රියාත්මක කිරීමට රජය සතු දේපළ භාරව සිටින සියලුම නිලධාරීන් බැඳී සිටී. එබැවින් අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන් ඇතුළු සියලුම රජයේ නිලධාරීන් මෙම විධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය. එමෙන්ම ස්වකීය පාලනය යටතේ ඇති සියලුම රාජ්‍ය නිලධාරීන් මෙම නියමයට අනුකූලව ක්‍රියා කරන බවට ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතු ය. මෙම නියම, සියලුම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය බැංකු, රාජ්‍ය විශ්වවිද්‍යාල යනාදී සියලුම රජයේ ආයතනවලට හා රජයට පවරා ගෙන ඇති සමාගම්වලට ද බලපැවැත්වේ.


1A - SH 1047 — 1250 (2018/01)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

02. නිලධාරීන්

i. රජයේ නිලධාරීන්ගේ හැකියාව, දැනුම හා ඔවුන්ගේ කාලය ද රාජ්‍ය දේපළක් වන හෙයින්, කිසිදු රාජ්‍ය නිලධරයකු ස්වකීය කාර්යාල වේලාව තුළ හෙවත් රාජකාරියට වාර්තා කර ඇති වේලාව තුළ හෝ රාජකාරි නිවාඩු ලබාගෙන ඇති විට හෝ කාර්යාලය තුළ හෝ කාර්යාලයෙන් බැහැරව දේශපාලනමය ප්‍රවර්ධන කටයුතුවල නොයෙදිය යුතු ය. දේශපාලන අයිතිවාසිකම් අහිමි නිලධාරීන් නිවාඩු ලබාගෙන හෝ දේශපාලනමය කාර්යයන්හි නිරත නොවිය යුතු ය. දේශපාලන අයිතිවාසිකම් හිමි නිලධාරීන්ට වුවද කාර්යාල වේලාව තුළ දේශපාලනමය කාර්යයන්හි නිරත විය හැක්කේ පූර්වයෙන් අනුමත කර ගත් පෞද්ගලික හෝ විශේෂ නිවාඩු මත පමණකි.

ii. කිසිදු නිලධාරියකුට හෝ සේවකයකුට දේශපාලනමය කටයුතු සඳහා රාජ්‍ය දේපළ එනම්, වෙනත් රජයේ නිලධාරීන්, වාහන, ප්‍රචාරක උපකරණ, මුද්‍රණ යන්ත්‍ර දුරකථන පහසුකම් යනාදී රජය සතු කිසිවක් භාවිතා කිරීමේ හිමිකමක් නැත. එසේ කිරීම සම්පූර්ණයෙන්ම තහනම් වේ.

iii. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මගින් පත් කර ඇති කොමිෂන් සභාවල බලතල යටතේ විධිමත් ලෙස කරනු ලබන බඳවාගැනීම්, පත්වීම්, උසස්වීම් හා මාරු කිරීම් හැර මෙම කාල සීමාව තුළදී රාජ්‍ය ආයතනයන්හි කිසිම ආකාරයක බඳවා ගැනීම්, පත්වීම් හා උසස්වීම් කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව සිදුකිරීමෙන් වැළකී සිටිය යුතු ය.

iv. ඡන්ද විමසීම් පැවැත්වීමට නියමිත ප්‍රදේශවල ඡන්ද විමසීම් රාජකාරි සඳහා යොදවා ගැනීමට අපේක්ෂිත රජයේ විද්‍යාලයන්හි ගුරුවරුන්, විදුහල්පතිවරුන් ඇතුළු සියලුම රජයේ නිලධාරීන්ගේ සාමාන්‍ය ස්ථාන මාරුවීම් නාමයෝජනා දැන්වීම් දින සිට ඡන්ද විමසීම අවසන් වී සති දෙකක් යන තුරු අත්හිටුවිය යුතු ය. ඡන්ද විමසීම් රාජකාරි සඳහා යොදවනු නොලබන රජයේ හෝ රාජ්‍ය සංස්ථා නිලධාරීන් හෝ ඡන්ද විමසීම් කාල සීමාව තුළ ස්ථාන මාරු කිරීමේ දී දේශපාලන හේතූන් මත එකී ස්ථාන මාරුවීම් සිදු නොකළ යුතු අතර එසේ සිදු කරනු ලැබූ බවට පැමිණිලි නොලැබෙන සේ අදාළ ස්ථාන මාරු කිරීම් සිදුකිරීම සියලුම බලධාරීන්ගේ වගකීම වේ. විනය නියෝග මත සිදු කෙරෙන ස්ථාන මාරුවීම් සඳහා මෙම නියමය බල නොපැවැත්වෙන අතර විශේෂ අවස්ථාවලදී හෝ සේවා අවශ්‍යතා මත ස්ථාන මාරුකිරීම් සිදු කිරීමට අවශ්‍ය නම් ඒ පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කර අනුමැතිය ලබාගත යුතු ය.

v. ඡන්ද විමසීම් ප්‍රකාශයට පත් කිරීමට පෙර ආරම්භ කර තිබූ නිලධාරීන් බඳවා ගැනීම්/උසස් කිරීම්වලට අදාළ දීප ව්‍යාප්ත වැඩපිළිවෙලක් හෝ අභ්‍යන්තර උසස් කිරීමේ වැඩපිළිවෙලක් කල් දැමීමකින් තොරව ක්‍රියාත්මක කළ යුතු යයි අමාත්‍යාංශ ලේකම්වරයා හෝ ආයතන ප්‍රධානීන් අපේක්ෂා කරන විට දී හා සමස්ත දිවයිනටම බලපාන පරිදි රාජ්‍ය සේවයට හෝ රාජ්‍ය ආයතනවලට අදාළව සිදු කෙරෙන වෙනත් බඳවා ගැනීම්/උසස් කිරීම් විධිමත් ව හා දේශපාලන මැදිහත්වීම්වලින් තොරව කෙරෙන බවට අදාළ බලධාරීන්ට නිසැක විය හැකි විටදී ඒ සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ එකඟතාව ලබාදිය හැකි ය. එවැනි අවස්ථාවලදී ඒ සඳහා කොමිෂන් සභාව වෙත ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු ය.

vi. සනීපාරක්ෂක, පිරිසිදු කිරීම් හා නඩත්තු කටයුතු බිඳවැටීම වැළැක්වීම සඳහා හා අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යෑම සඳහා ප්‍රාදේශීයව හෝ පළාත් බදව හෝ රජයට සේවකයන් බඳවා ගැනීම් සිදු කරන්නේ නම්, එවැනි බඳවා ගැනීම් වුවද කොමිෂන් සභාවේ එකඟතාව මත සිදු කළ යුතු අතර කිසිදු දේශපාලනමය මැදිහත්වීමකින් තොරව විනිවිද බවින් යුතුව එවැනි කටයුතු සිදු කිරීමේ වගකීම අදාළ නිලධාරීන් වෙත පැවරේ.

03. උත්සව, ජංගම සේවා සහ වෙළඳ ප්‍රදර්ශන

(i) උත්සව

ඡන්ද විමසීම් කාලය තුළ රජයේ මුදල් වැය කරමින් පවත්වනු ලබන විවිධ ආකාරයේ මුල්ගල් තැබීම්, විවෘත කිරීම්, ජනතා අයිතියට පැවරීම් වැනි උත්සව දේශපාලනඥයන්ගේ සහභාගීත්වයෙන් සිදුකෙරෙන අවස්ථාවලදී ඡන්ද විමසීමට අදාළව නොයෙකුත් මකිමහාන්තර ඔවුන් වෙතින් ප්‍රකාශ වන බැවින් සහ මෙවැනි අවස්ථා උත්සවාකාරයෙන් පැවැත්වීම හරහා යම් පක්ෂයක්/කණ්ඩායමක් හෝ අපේක්ෂකයකු ප්‍රවර්ධනය කිරීමක් හෝ වෙනත් පක්ෂයකට/කණ්ඩායමකට/අපේක්ෂකයකුට අගතියක් සිදු විය හැකි හෙයින්, මෙම ඡන්ද විමසීම් කාලය තුළ එබඳු උත්සව හා කාර්යයන් සංවිධානය කිරීමෙන්, පැවැත්වීමෙන් වැළකී සිටිය යුතු ය. ඡන්ද විමසීම් නිවේදනය නිකුත් කිරීමට පෙර දින නියම කරන ලද එවැනි උත්සව අවලංගු කිරීමට හෝ කල් තැබීමට හැකියාවක් නැත්නම් එවැනි උත්සව පිළිබඳ මැතිවරණ කොමිෂන් සභාව වෙත වාර්තා කර උපදෙස් ලබා ගත යුතු වේ. යම් හෙයකින් රජයේ මුදල වැය කරමින් මෙවැනි උත්සව පවත්වනු ලැබුවහොත් එවැනි අවස්ථාවකදී පක්ෂ/කණ්ඩායම්/අපේක්ෂකයන් ප්‍රවර්ධනය හෝ අගතියට පත් කිරීම් සිදුවහොත් ඒ පිළිබඳව උත්සවය සංවිධානය කරන ලද නිලධාරීන් වගකිව

යුතු ය. එමෙන්ම ඡන්ද විමසීම් කාලය තුළ පැවැත්වෙන මෙවැනි උත්සව සම්බන්ධයෙන් නිරීක්ෂණය කර වාර්තා කබා ගැනීම පිණිස අදාළ දිස්ත්‍රික්කවල භාරීම්භාර නිලධාරීන් කල්වේලා ඇතිව දැනුවත් කිරීමට මෙම කාර්යයන් සංවිධානය කරන නිලධාරීන් ක්‍රියා කළ යුතු ය. මෙවැනි උත්සවයකදී පක්ෂ/කණ්ඩායම්/අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා හෝ අගතියට පත් කිරීම සඳහා කිසිදු ආකාරයක ප්‍රකාශයක් කිරීම, ක්‍රියාකාරකමක් සිදු කිරීම, ධජ/පතාක/පෝස්ටර්/පත්‍රිකා/දැන්වීම් ප්‍රදර්ශනය හෝ බෙදාහැරීම සම්පූර්ණයෙන්ම තහනම් අතර එවැනි කාර්යයන් වැළැක්වීමට අදාළ උත්සව සංවිධානය කරන හෝ අරමුදල් සපයන රාජ්‍ය ආයතන හා නිලධාරීන් බැඳී සිටී.

(ii) ජංගම සේවා සහ වෙළඳ ප්‍රදර්ශන :
ජනතාවට සේවා සැපයීමේ අරමුණින් රාජ්‍ය මුදල් හා රාජ්‍ය දේපළ වැය කරමින් පැවැත්වෙන මෙවැනි ජංගම සේවා හා වෙළඳ ප්‍රදර්ශන හරහා ද පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධන කාර්යයන් සිදු කිරීමේ ප්‍රවණතාවක් පවතින හෙයින්, මෙම ඡන්ද විමසීම් කාලය තුළ එබඳු ජංගම සේවා, වෙළඳ ප්‍රදර්ශන හා සැණකෙළි යනාදී කාර්යයන් සංවිධානය කිරීමෙන්, පැවැත්වීමෙන් වැළකී සිටිය යුතු ය. ඡන්ද විමසීම් නිවේදනය නිකුත් කිරීමට පෙර දින නියම කරන ලද එවැනි ජංගම සේවා, වෙළඳ ප්‍රදර්ශන හා සැණකෙළි, අවලංගු කිරීමට හෝ කල්තැබීමට හැකියාවක් නැත්නම් එවැනි ජංගම සේවා, වෙළඳ ප්‍රදර්ශන හා සැණකෙළි පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාව වෙත වාර්තා කර උපදෙස් ලබා ගත යුතු වේ. යම් හෙයකින් රජයේ මුදල් වැය කරමින් මෙවැනි ජංගම සේවා, වෙළඳ ප්‍රදර්ශන හා සැණකෙළි යනාදිය පවත්වනු ලැබුව හොත් එවැනි අවස්ථාවකදී පක්ෂ/කණ්ඩායම්/ අපේක්ෂකයන් ප්‍රවර්ධනය හෝ අගතියට පත් කිරීම් සිදුවුවහොත් ඒ පිළිබඳව අදාළ කාර්ය සංවිධානය කරන ලද නිලධාරීන් වගකිව යුතු ය. එමෙන්ම ඡන්ද විමසීම් කාලය තුළ පැවැත්වෙන මෙවැනි ජංගම සේවා, වෙළඳ ප්‍රදර්ශන හා සැණකෙළි යනාදිය සම්බන්ධයෙන් නිරීක්ෂණය කර වාර්තා තබා ගැනීම පිණිස අදාළ දිස්ත්‍රික්කවල භාරීම්භාර නිලධාරීන් කල්වේලා ඇතිව දැනුවත් කිරීමට මෙම කාර්යයන් සංවිධානය කරන නිලධාරීන් ක්‍රියා කළ යුතු ය. මෙවැනි කිසිදු ජංගම සේවා, වෙළඳ ප්‍රදර්ශන හා සැණකෙළියක දී හෝ එවැනි වෙනත් අවස්ථාවකදී පක්ෂ/කණ්ඩායම් හෝ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා නැතහොත් අගතියට පත් කිරීම සඳහා කිසිදු ආකාරයක ප්‍රකාශයක් කිරීම, ක්‍රියාකාරකමක් සිදු කිරීම, ධජ/පතාක/පෝස්ටර්/පත්‍රිකා/දැන්වීම් ප්‍රදර්ශනය හෝ බෙදා හැරීම සම්පූර්ණයෙන්ම තහනම් අතර එවැනි කාර්යයන්ට වැළැක්වීමට අදාළ කාර්යය සංවිධානය කරන හෝ අරමුදල් සපයන රාජ්‍ය ආයතන හා නිලධාරීන් බැඳී සිටී.

04. පහසුකම්, ප්‍රදාන ලබාදීමේ වැඩසටහන් හා විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

i. ජනතාවට පහසුකම් සැළසීම සඳහා හෝ රටේ සංවර්ධනය සඳහා සිදු කරන දීර්ඝකාලීන හෝ මධ්‍යකාලීන විශේෂ ව්‍යාපෘති හෝ පහසුකම් ලබාදීමේ අඛණ්ඩ වැඩසටහන් ඡන්ද විමසීම හේතුවෙන් අත්හිටුවිය නොහැකි නමුත් ඡන්ද විමසීම් නිවේදනය නිකුත් කිරීමෙන් පසු මෙවැනි විශේෂ ව්‍යාපෘති හෝ අඛණ්ඩ වැඩසටහන් හරහා පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධනය කිරීම් හෝ අගතියට පත්කිරීම් සඳහා යොදා ගැනීමට ඉඩ නොදිය යුතු ය.

ii. ඡන්ද විමසීම් කාලය තුළ සිදු කරන මෙවැනි අඛණ්ඩ වැඩසටහන් හා ව්‍යාපෘති හරහා පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධන කටයුතු සිදු කරන්නේ ද යන්න කොමිෂන් සභාව නිරීක්ෂණය කරනු ලැබේ.

iii. ඡන්ද විමසීම් කාල සීමාව තුළ රජයේ ඉඩම් බෙදාදීම, රජයේ ඉඩම් හිමිකම් ඔප්පු හෝ නිවාස අයිතිය පැවරීමේ ඔප්පු ප්‍රදානය කිරීම්, වැවිලි කර්මාන්ත සඳහා හෝ වගා කටයුතු සඳහා සහනාධාර, පොහොර, කෘෂි උපකරණ, ක්‍රීඩා භාණ්ඩ, ස්වයං රැකියා සඳහා උපකරණ, පාපැදි, සූර්ය බල විදුලි පහන්, නිවාස ඉදිකිරීම් සඳහා වූ ගොඩනැගිලි ද්‍රව්‍ය යනාදිය බෙදාහැරීමේ ව්‍යාපෘති හා නිවාස ණය නිකුත් කිරීම්/වන්දි මුදල් ප්‍රදානය කිරීම් යනාදී වැඩසටහන් ආරම්භ කිරීම අත්හිටුවිය යුතු ය. එසේ අත්හිටුවීම නිසා ජනතාවගේ අවශ්‍යතා ඉටු කිරීමට බාධාවක් ඇති වන බව පෙනී යන්නේ නම්, ඒ සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව වෙත දන්වා උපදෙස් ලබාගත යුතු ය. යම් හෙයකින් දැනටමත් ආරම්භකර ඇති හෝ අනුමැතිය ලබාදෙන මෙවැනි වැඩ සටහන් හෝ කාර්යයන් අඛණ්ඩව සිදු කිරීමට සිදුවුවහොත් එකී කාර්යයන් එම විෂය භාර නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පමණක් කිසිදු පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂකයන් ප්‍රවර්ධනයක් නැතහොත් අගතියට පත් කිරීමක් සිදු නොවන පරිදි ක්‍රියාත්මක කිරීම එම කාර්යයන් හා වැඩසටහන් භාර නිලධාරීන්ගේ වගකීම වේ.

05. වාහන

i. මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා රජය සතු මෝටර් රථ, ජීප් රථ, කැබ් රථ, බස් රථ ආදී සියලුම රජයේ වාහන භාරව සිටින නිලධාරීන් එම වාහන කිසිම දේශපාලන පක්ෂයක, ස්වාධීන කණ්ඩායමක හෝ අපේක්ෂකයකුගේ මැතිවරණ ප්‍රචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහා භාවිතා නොවන ආකාරයට මැතිවරණ කාල සීමාව තුළ වාහන සංචිතය නඩත්තු කිරීම හා වෙන්කර දීම විශේෂ අවධානයකින් යුතුව සිදු කළ යුතු ය. නිලධාරීන්ට වෙන් කර ඇති (assigned vehicles) රජය සතු වාහන සහ කුලියට ලබාගෙන රාජකාරි කටයුතු සඳහා යොදවන වාහන ද මීට ඇතුළත් වන බව සැලකිය යුතු ය. මෙම කාල සීමාව තුළ දී නිලධාරීන්ට වෙන්කර ඇති (assigned vehicles) වාහන

හැර විශේෂයෙන්ම සංචිතවලට අනුයුක්ත වාහන සහ අතිකුත් වාහන සඳහා ධාවන සටහන් නියමාකාරයෙන් පවත්වා ගත යුතු අතර, මෙම ධාවන සටහන් මාණ්ඩලික නිලධාරියකු විසින් දිනපතා පරීක්ෂා කර එම වාහන මැතිවරණ ප්‍රචාරක කටයුතුවලට නොයෙදෙන බවට සහතිකවීමකට පත්විය යුතු ය. රාජකාරි කටයුතු සඳහා යෙද වූ බව ව්‍යාජ සටහන් යොදා රජයේ වාහන දේශපාලනමය ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් හෝ එවැනි අනීතික කරුණු සඳහා රජයේ වාහන නොයෙදවීමට වගබලා ගත යුතු ය.

ii. ජනාධිපතිවරයාගේ ආරක්ෂක අංශය සඳහා වෙන් කර ඇති වාහන දෙකකට හැර වෙන කිසිදු වාහනයකට මෝටර් රථ දෙපාර්තමේන්තුව විසින් වෙන් කරනු ලබූ අනන්‍ය ලියාපදිංචි අංකය රහිතව ධාවනය කළ නොහැකි බැවින් කිසිදු අමාත්‍යවරයෙකුට, නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට, ඔවුන්ගේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ට හෝ වෙනත් කිසිවකුට අදාළ නියමිත ලියාපදිංචි අංකය රහිතව රජයේ හෝ රාජ්‍ය ආයතනවල වාහන භාවිතා කළ නොහැකි ය. එබැවින් සියලු දෙපාර්තමේන්තු රාජ්‍ය ආයතන සතු වාහන, ගරාජ අංකවලින් (ව්‍යාජ අංකවලින්) ධාවනයේ නොයෙදෙන බවට අමාත්‍යාංශ ලේකම්වරුන්/දෙපාර්තමේන්තු ප්‍රධානීන් නිසැක විය යුතු යි.

iii. දේශපාලනමය ප්‍රචාරක කාර්යයන් සඳහා ගුවන් යානා හා හෙලිකොප්ටර් හෝ වෙනත් වාහන යොදා ගැනීම පිණිස රජයේ මුදල් වැය නොකරන බවට සියලුම අමාත්‍යාංශ ලේකම්වරු හා ආයතන ප්‍රධානීන් නිසැක විය යුතු ය.

06. රජයේ කාර්යාල, ගොඩනැගිලි, පාසැල්, රජය සතු වෙනත් ගොඩනැගිලි සහ සංචාරක නිවාස ආදිය

i. රජයේ කාර්යාල, ගොඩනැගිලි, පාසැල්, රජය සතු වෙනත් ගොඩනැගිලි සහ සංචාරක නිවාස ආදිය ද රජයේ සම්පත් වේ. එම නිසා එම ගොඩනැගිලි දේශපාලන රැස්වීම්, සාකච්ඡා ආදියට යොදවා ගැනීම ද නොකළ යුතු ය. සාමාන්‍ය කාලසීමාව තුළදී ඕනෑම දේශපාලන පක්ෂයකට/කණ්ඩායමකට මුදල් ගෙවා වෙන් කර ගත හැකි ගොඩනැගිලි හා ශාලා, ඡන්ද විමසීම් කාල සීමාව තුළද නිසි පරිදි ගාස්තු අය කර කිසිදු පක්ෂයකට/කණ්ඩායමකට වෙනස්ව සැලකීමකින් තොරව ලබා දීමට කිසිම විධානවලින් බාධාවක් ඇති බව නොසැලකිය යුතු ය. මැතිවරණ ප්‍රචාරක කටයුතුවල යෙදී සිටින පුද්ගලයින් රජය සතු සංචාරක නිවාස, තානායම්, නිවාඩු නිකේතන ආදිය ද නොමිලේ ලබාදීම සම්පූර්ණයෙන්ම තහනම් වේ. අදාළ පළාත්වල පිහිටි රජයේ හෝ රාජ්‍ය ආයතන සතු සංචාරක නිවාස, තානායම්, නිවාඩු නිකේතන යනාදිය කිසිදු දේශපාලනඥයකුට, නිලධරයකුට, වෙනත් පුද්ගලයෙකුට ඡන්ද විමසීම් කාලසීමාව තුළ පූර්ණකාලීනව වෙන් කර දීමෙන් වැළකිය යුතු ය. එමෙන්ම එවැනි ස්ථානවල නවාතැන් ගන්නා පුද්ගලයින්ට දේශපාලන පක්ෂ හෝ අපේක්ෂකයින් ප්‍රවර්ධනය කිරීමේ කටයුතුවල නිරත වීමට ඉඩ නොදිය යුතු ය. රජය සතු ගොඩනැගිලි සහ ඒවා පිහිටි භූමිවල දේශපාලන පක්ෂවල හා අපේක්ෂකයින්ගේ මැතිවරණ ප්‍රචාරක දැන්වීම්, පෝස්ටර් කටවුට් ආදිය ප්‍රදර්ශනය කිරීමට ද ඉඩ නොදිය යුතු ය.

ii. රජය, පළාත් සභා හා පළාත් පාලන ආයතන සතු ක්‍රීඩා පිටි හෝ හිස් ඉඩම් හා ශාලා හෝ එවැනි වෙනත් ගොඩනැගිලි එක් එක් දේශපාලන පක්ෂ/ස්වාධීන කණ්ඩායම් හා අපේක්ෂක ප්‍රවර්ධන ප්‍රචාරක රැස්වීම් සඳහා වෙන් කිරීමේදී කිසිදු පක්ෂයකට, ස්වාධීන කණ්ඩායමකට හෝ අපේක්ෂකයකුට විශේෂ සැලකිල්ලක්, ප්‍රමුඛතාවක් හෝ අඩු සැලකිල්ලක් ලැබෙන පරිදි වෙන් කර දීම් නොකළ යුතු ය. එකී ස්ථාන, ගොඩනැගිලි වෙන් කර දීම විනිවිදබවින් යුතුව සිදු කළ යුතු ය. එවැනි ස්ථාන සෙසු පක්ෂයකට/කණ්ඩායම්වලට ලබා ගැනීමට නොහැකිවන පරිදි, කිසිදු පක්ෂයකට/කණ්ඩායමකට/අපේක්ෂකයකුට හෝ වෙනත් කාර්යයක් සඳහා දිගින් දිගටම වෙන් කර තැබීම නොකළ යුතු ය.

07. පොදු කරුණු

i. රාජ්‍ය දේපළ විශේෂයෙන්ම රජයේ ආයතන, වාහන, බඩු බාහිරාදිය හා නිලධාරීන් ඡන්ද විමසීමට අදාළ පක්ෂ/කණ්ඩායම් හෝ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා යෙදවීමට කිසිදු අවකාශයක් නොදිය යුතු ය. ඡන්ද විමසීම පැවැත්වෙන ප්‍රදේශවල හදිසි රාජකාරි කටයුතු හෝ විශේෂ සංවර්ධන ව්‍යාපෘති ඉටු කිරීම යනාදී කරුණු ඉදිරිපත් කරමින් පක්ෂ/කණ්ඩායම්/අපේක්ෂක ප්‍රවර්ධනය කිරීම සඳහා (නැතහොත් අගතියට පත් කිරීම සඳහා) රජයේ/රාජ්‍ය ආයතනවල නිලධාරීන් හා රජයේ/රාජ්‍ය ආයතන සතු හෝ කුලියට ගත් වාහන වෙනත් කාර්යාලවලට හා ආයතනවලට අනුයුක්ත කිරීම් හෝ මුදා හැරීම් වැනි අකටයුතු සිදු කිරීමට කිසිදු නිලධරයකුට ඉඩ නොදිය යුතු ය. රජයේ, පළාත් සභාවල, පළාත් පාලන ආයතනවල හෝ රාජ්‍ය සංස්ථා, මණ්ඩල, රාජ්‍ය බැංකු, ව්‍යවස්ථාපිත වෙනත් ආයතන, රජයේ විශ්වවිද්‍යාල යනාදී කිසිදු රාජ්‍ය ආයතනයක් සතු මාධ්‍ය ඒකකවලට අයත් නිලධාරීන්, වාහන, උපකරණ කිසිදු පක්ෂයක්, කණ්ඩායමක්, අපේක්ෂකයකු ප්‍රවර්ධනය වන කාර්යයන් සඳහා යොදා ගැනීම නොකළ යුතු ය. සාමාන්‍ය තත්ත්වය යටතේ යම් රාජ්‍ය ආයතනයක් සභා වේදිකා, සැරසිලි කිරීම්, උපකරණ, වාහන, ගුවන්යානා, හෙලිකොප්ටර් කුලී පදනම මත ලබා දෙන්නේ නම් ඡන්ද විමසීම් කාලය තුළ එවැනි කුලියට දීම් සියලුම පක්ෂ, කණ්ඩායම් සඳහා ලබා ගැනීමේ අවස්ථා සහිතව විනිවිද බවින් යුතු ව ඉටු කළ යුතු ය.

ii. රජයේ සංවර්ධන කටයුතු පිළිබඳව හෝ යා කිසි සාංවත්සර/අනුස්මරණ උත්සව ආදිය සඳහා හෝ ප්‍රචාරක කටයුතු සිදු කිරීම පිණිස රාජ්‍ය මුදල් වැය කරමින් ( පුවත්පත් ගුවන්විදුලි, ප්‍රවෘත්ති පත්‍ර යනාදී මාධ්‍ය හරහා දැන්වීම් විකාශය කිරීම්/පළ කිරීම් මගින් හෝ ප්‍රචාරක දැ න්වීම් පුවරු ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කිරීම මගින් හෝ කිසිදු පක්ෂයක්/කණ්ඩායමක්/අපේක්ෂකයකු වෙ නුවෙන් ප්‍රවර්ධන කටයුතු හෝ අගතියට පත්කිරීමේ කටයුතු සිදු නොකළ යුතු ය.

iii. ඡන්ද විමසීමක දී පක්ෂ/කණ්ඩායම්/අපේ ක්ෂක ප්‍රවර්ධනය කිරීම හෝ අගතියට පත් කිරීමේ කාර්යයන් වෙනුවෙන් රාජ්‍ය දේපළ භාවිතා කිරීම වළක්වාලමින් ද ඇති මෙම තහනම කිසිදු ලිහිල් කිරීමකින් තොරව තදින්ම ක්‍රියාත්මක කළ යුතු ය. ඒ ඒ අමාත්‍යාංශය යටතේ ඇති සියලුම දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා වෙනත් ආයතනවල ප්‍රධානීන්ට ද මේ පිළිබඳව උපදෙස් දීමට අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් ක්‍රියා කළ යුතු ය. එමෙන්ම එම සියලු ආයතනවල නිලධාරීන් මෙම උපදෙස් හා නියමයන්ට අනුකූලව ක්‍රියාකරන බවට අමාත්‍යාංශ ලේකම්වරුන් හා ආයතන ප්‍රධානීන් නිසැකවීම අත්‍යවශ්‍යය.

iv. ඡන්ද විමසීමට අදාළ සියලුම නීති බලාත්ම ක කිරීමට, සුරක්ෂිත කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට සහාය දැක්වීම, අදාළ නීති බලාත්මක කිරීම භාරව සිටින සි යලුම රජයේ බලධරයන්ගේ කාර්යය විය යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (2) ව්‍යවස්ථාවෙහි කර ඇති සඳහන පිළිබඳව රාජ්‍ය නිලධාරීන්ගේ අවධානය යොමු කිරීම අත්‍යවශ්‍යය වේ.

v. මෙම විධානවල සඳහන් කරුණු පිළිබඳව අමාත්‍යවරු, රාජ්‍ය අමාත්‍යවරු, නියෝජ්‍ය ඇමතිවරු සහ අමාත්‍ය කාර්ය මණ්ඩල දැනුවත් කිරීම අමාත්‍යාංශ ලේකම් වරයා වෙත පැවරෙන බවද පළාත් සභාවල ප්‍රධාන අමාත්‍යවරුන් හා සෙසු අමාත්‍යවරුන් සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩල දැනුවත් කිරීම, ප්‍රධාන ලේකම්වරයා හා අදාළ පළාත් සභා අමාත්‍ය ලේකම්වරුන්ගේ වගකීම බව ද සැළකිය යුතු ය.

vi. අදාළ වන විට කොමිෂන් සභාවල ලේක ම්වරුන් එකී කොමිෂන් සභාවල සභාපතිවරුන් හා සාමාජිකයන් මෙම විධාන පිළිබඳව දැනුවත් කිරීමට ක්‍රියා කළ යුතු ය.

vii. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කරුණු ට අමතරව, අමාත්‍යාංශවල/දෙපාර්තමේන්තුවල/ආයතනවල ප්‍රධානීන්, ප්‍රධාන ගණන් දීමේ නැතහොත් ගණන් දී මේ නිලධාරීන් ද වන හෙයින් රජය සතු දේපළ අනිසි ලෙස පරිහරණය කිරීම වැළැක්වීම අදාළ නිලධාරීන් වෙත පැවරුණු වගකීමක් වේ.

viii. මෙම විධානවලට අනුකූලව කටයුතු නො කිරීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 (උඋ) අනු ව්‍යවස්ථාව ප්‍රකාර දඬුවම් ලැබිය හැකි වරදක් බවද සඳහන් කරනු ලැබේ.

මෙම විධානවල රජය යනුවෙන් යෙදී ඇති සෑම ස්ථානයකදීම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුළු සියලු රජයේ ආයතන, පළාත් සභා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය බැංකු, රාජ්‍ය විශ්වවිද්‍යාල, රජයට පවරාගත් සමාගම් යන සියලුම ආයතන හා 50% කට වඩා කොටස් රජය හෝ රාජ්‍ය සමාගම් සතු ආයතන ද අදහස් වේ.

රජයේ නිලධාරීන් හා සේවකයන් යනුවෙන් යෙදී ඇති සෑම ස්ථානයකම පෙර සඳහන් ආයතනවල සේවයේ නිරත හා සේවයේ යොදවා ගෙන සිටින වේතනයක් හෝ දීමනාවක් ලබන සියලුම තැනැත්තන් අදහස් වේ.

2.9